# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,419 - 2025 ජනවාරි මස 10 වැනි සිකුරාදා - 2025.01.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම ... ... | 08 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් | |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ජනවාරි මස 31 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ජනවාරි මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


7 - B 082644 — 177 (2025/01)
C 1 -

# පිස්කල් විකිණීම්

**කොළඹ දී පවත්වනු ලබන සිවිල් (වාණිජ) අධිකරණ බලය ක්‍රියාත්මක කරන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය.**

මහනුවර ලේවැල්ල පාරේ අල්විස් මාවතේ පිහිටි පර්චස් 32 ක ඉඩමක් පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී,
බැන්ක් ඔෆ් සිලෝන් මර්චන්ට් ටවර්,
අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.

*පෙර* : මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී,
බැන්ක් ඔෆ් සිලෝන් මර්චන්ට් ටවර්,
අංක 28, ශාන්ත මයිකල් පාර, කොළඹ 03.

*නඩු අංකය* : CHC/135/2011/MR
මහනුවර දිසා අධිකරණයේ
ඇස්කිසි අංකය : 135/2024

............*පැමිණිලිකරු.*

*එදිරිව*

1. කහවේ විදානෙලාගේ දොන් ප්‍රේමදාස විජේගුණරත්න,
2. රවීන්ද්‍ර චන්ද්‍රසිරි විජේගුණරත්න,

*දෙදෙනාම* : මවුන්ට් ක්‍රෙස්ට්, අලුත්ගම පාර, යටදොල වත්ත, මතුගම.

.............*විත්තිකරුවෝ.*

කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති දේපළ විකිණීමේ අධිකාරි පත්‍රයට අනුව එම නඩුවේ 2023 මැයි මස 29 වැනි දින ඇතුළත් කර ඇති තීන්දු ප්‍රකාශයට අනුව ඉහත විත්තිකරුවන්ගෙන් රුපියල් දෙමිලියන එක් ලක්ෂ දහතුන් දහස් අටසිය තිස් හයයි ශත පනස් හතක (රු. 2,113,836.57) මුදලක් සහ රුපියල් එක් මිලියන තුන් ලක්ෂ හැත්තෑ හය දහස් හතරයි ශත හැට හයක් (රු. 1,376,004.66) ඉතිරි ප්‍රාග්ධන මුදලක් මත, 2010 මැයි මස 19 වැනි දින සිට එම මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් වර්ෂයකට සියයට තිහක (30%) අනු ප්‍රමාණයක් අනුව පොළියක් ද, ගෙවීමට නියෝග කර ඇති හෙයින් ද, දෙවැනි නඩු නිමිත්ත මත රුපියල් තුන් මිලියන අට ලක්ෂ තිස් දහස් අටසිය අනූ දෙකයි ශත පනහක ( රු. 3,830,892.50) මුදලක් සහ රුපියල් දෙමිලියන හාර ලක්ෂ විසිඑක් දහස් එකසිය එකොළහයි ශත අනූ තුනක් (රු. 2,421,111.93) වූ ඉතිරි ප්‍රාග්ධන මුදලක් මත 2010 මැයි මස 19 වැනි දින සිට එම මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් වර්ෂයකට සියයට තිහක (30%) අනු ප්‍රමාණයක් අනුව පොළියක් ගෙවීමට නියෝග කර ඇති හෙයින් ද, එකී විත්තිකරුවන් විසින් පැමිණිලිකරුට එම මුදල් ගෙවීමට අපොහොසත් වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයේ විස්තර වන දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා එම මුදල් අයකර ගන්නා ලෙසට මා වෙත නියෝග කර ඇති බැවින් එම දේපළ පිළිබඳ වෙන්දේසිය,

**2025 ජනවාරි මස 29** වැනි දින ප. ව. **2.00** ට,

එකී දේපළ පිහිටි ස්ථානයේ දී මවිසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බවට මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

*දේපළට පිවිසෙන මාර්ගය.-*

මහනුවර නගරයේ සිට මහියංගන මාර්ගයේ කි. මී. 5ක් පමණ ගිය විට වම් පැත්තට ඇති වංගුව සහිත ලේවැල්ල මාර්ගයට හැරී මීටර් 25කින් පමණ හමුවන ගංගාරාම විහාරස්ථානය පසුකර වම් පැත්තට ඇති පී. එල්. පී. අල්විස් මාවතේ මීටර් 400ක් පමණ ගිය විට වම් පැත්තට මෙම දේපළ පිහිටා තිබේ. අල්විස් මාවතෙන් ඇතුල් වූ විට වම් පැත්තෙන් ද ප්‍රවේශ මාර්ගයක් වේ.

*වෙන්දේසියේ දී ගෙවීමේ ක්‍රමය.-*

වෙන්දේසිය අවසන් වූ වහාම මහනුවර දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා වෙත පහත දැක්වෙන පරිදි මුදල් ගෙවිය යුතුය. සියලුම ගෙවීම් මුදලින් හෝ බැංකු අණකර මගින් පමණක් ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

01. සම්පූර්ණ විකුණුම් මුදලින් සියයට විසිපහක (25%) මුදලක් එවලේම මා වෙත ගෙවිය යුතු ය. ඉතිරි සියයට හැත්තෑ පහක (75%) මුදල වෙන්දේසි දින සිට දින තිහක් (30) ඇතුළත මහනුවර දිසා අධිකරණයේ ඉහත ඇස්කීසි අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

02. මීට අමතරව සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය යටතේ වන පිස්කල් ගාස්තු ද එම අවස්ථාවේ දී ම මා වෙත ගෙවිය යුතුය.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර නගර සභා සීමාව තුළ තෙල්වත්ත ගමෙහි පිහිටා ඇති ලේවැල්ල පාරේ වරිපනම් අංක 21/35 දරන ලේවැල්ල ස්ටේට් *නොහොත්* ස්ටෝරුවේ වත්ත නැමැති ඉඩමට එච්. ටී. ද සිල්වා බලයලත් මිනින්දෝරු විසින් 2007 දෙසැම්බර් 29 වැනි දින දරන මැන සාදන ලද අංක 1500 දරන පිඹුරේ කැබලි අංක 1ට මායිම්, උතුරට : ලේවැල්ල පාර ද, නැගෙනහිරට : පිඹුරු අංක 2293 හි කැබලි අංක 57 ද, දකුණට : කැබලි අංක 58 (පාර) ද, බටහිරට : පිඹුරු අංක 2293 හි කැබලි අංක 55ට මායිම් වූ පර්චස් තිස් දෙකකින් (පර්. 32) යුතු වූ මුළු බිම් ප්‍රමාණය හා ඒ තුළ පිහිටි ගහකොළ, පලතුරු ආදී සෑම සියලු දේ ද වේ.

ඉහත කියන ලද අංක 1500 පිඹුරේ කැබලි අංක 1 යනු, ඒ. බී. කිරිදෙන වරලත් මානව තැන විසින් 1984 නොවැම්බර් මස 26 වැනි දින අංක 2293 පිඹුරේ කැබලි අංක 56 ලෙස ද මැන දැක් වූ පහත විස්තර කරනු ලබන ඉඩමේ ද නැවත මැනීමක් වේ.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර නගර සභා සීමාව තුළ තෙල්වත්ත ගමෙහි පිහිටා ඇති ලේවැල්ල පාරේ වරිපනම් අංක 19/21, 21/1 සිට 21/4 දරන ලේවැල්ල ස්ටේට් *නොහොත්* ස්ටෝරුවේ වත්ත නැමැති ඉඩමට පී. එච්. ටී. ද සිල්වා බලයලත් මිනින්දෝරු විසින් 1978 මාර්තු 26 වැනි දින මැන සාදන ලද අංක 1643 දරන පිඹුරේ කැබලි අංක 56ට මායිම්, උතුරට : ප්‍රසිද්ධ පාර ද, නැගෙනහිරට : කැබලි අංක 57 ද, දකුණට : කැබලි අංක 58 (පාර) ද, බටහිරට : කැබලි අංක 55ට මායිම් වූ පර්චස් තිහකින් (පර්. 30) යුතු වූ මුළු බිම් ප්‍රමාණය හා ඒ තුළ පිහිටි ගහකොළ, පලතුරු ආදී සෑම සියලු දේ ද වේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 321/48, 26 හි ලියාපදිංචි වී ඇත.

තව ද, පහත විස්තර වන ඉඩමේ මාර්ග අයිතිය ද සමග වේ :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර නගර සභා සීමාව තුළ තෙල්වත්ත ගමෙහි පිහිටා ඇති ලේවැල්ල ස්ටේට් *නොහොත්* ස්ටෝරුව වත්ත නැමැති ඉඩමට පී. එච්. ටී. ද සිල්වා බලයලත් මිනින්දෝරු විසින් 1978 මාර්තු 26 වැනි දින මැන සාදන ලද අංක 1643 දරන පිඹුරේ කැබලි අංක 58 (පාර සඳහා වෙන් වූ බිම් තීරයට මායිම්) උතුරට : ගෝමස් ගේ ඉඩම ද, නැගෙනහිරට : කැබලි අංක 53, 54,55,56 සහ 57 රබර් වත්ත හා කැබලි අංක 17, 18, 21, 23, 24, 25 සහ ගංගාරාම පන්සල් ඉඩම් ද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, බටහිරට : රජයේ පාර, උඩවත්ත කැලේ කැබලි අංක 44, 49, 46, 48, 50, 51 සහ 52 ට මායිම් වූ අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් දහයකින් (අ. 1, රූ. 2, පර්. 10) යුතු වූ මුළු බිම් ප්‍රමාණය වේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 377/138 හි ලියාපදිංචි වී ඇත.

ඒ. ඒ. එන්. සී. අලුත්ගම,<br>
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්/සාමවිනිසුරු,<br>
දිසා අධිකරණය,<br>
මහනුවර.

2025 ජනවාරි මස 02 වැනි දින,<br>
මහනුවර දිසා අධිකරණයේ දී ය.

01-52

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.